# සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

## නිවාඩු කාලීන පැවරුම - 06 වන සතිය - බුද්ධ ධර්මය - 4 ශ්‍රේණිය

සැකසුම - එම්.වී.සම්පත් බන්ධු ගුණසේකර - ර/බළ/වෙළගපොළ විද්‍යාලය

### <u>වාචික කොටස</u>

1. බුදුරජාණන් වහන්සේ නාගදීපයට වැඩම කළේ බුද්ධත්වයට පත් කීවන වසරේ ද?
2. මැණික් පුටුවේ අරගලයට සම්බන්ධ වූයේ කවුරුන් ද?
3. **ධම්මං විනා නත්ථි පිතා ච මාතා** යන ගාථාව කියන්න.
4. **සුනාථ ධාරේථ චරාථ ධම්මෙ** යන ගාථා පාඨයේ තේරුම කියන්න.
5. බුදුරජාණන් වහන්සේ නාගදීපයට වැඩියේ ලංකාවට වැඩම කළ කී වැනි වාරයේ දී ද?
6. එසේ වැඩම කළේ කුමන මාසයේ ද?
7. එදින නාගදීපයේ සිදු වීමට තිබූ අරගලය කුමක් ද?
8. ගැටුමට මුල් වූ මැණික් පුටුවට කළේ කුමක් ද?
9. නාගදීප චෛත්‍ය හඳුන්වන අනෙක් නම කුමක් ද?
10. මහෝදර නා රජට උදව්වට පැමිණියේ කවුද? ඔහු කුමන ප්‍රදේශයේ රජකම් කළේ ද?

### <u>ලිඛිත කොටස</u>

- පහත සඳහන් වැකි හරි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද වරහන් තුළ යොදන්න.

1. ධම්මං විනා නත්ථි පිතා ච මාතා යන ගාථාව ධම්ම පද ගාථාවකි. (   )
2. රසවාහිනිය රචනා කළේ වේදේහ හාමුදුරුවන් විසිනි. (   )
3. චූලෝදර නා රජු රජකම් කළේ නාගදීපයේ ය. (   )
4. නා රජවරුන් ඇතුළු පිරිස බුදුරදුන්ට බුලත් කොළය බැගින් පූජා කර සමගි විය. (   )
5. නාගදීප චෛත්‍ය පිහිටි ස්ථානයේ කිරිපලු රුකක් ඇති බව සඳහන් වේ. (   )

- හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. ධම්මං විනා නත්ථි පිතා ච මාතා යන ගාථාව සඳහන් වන්නේ ................කතාවේ ය.

   (පූතිගත්තතිස්ස තෙරණුවන්ගේ / කුඩ්ඩරජ්ජවාසී තෙරණුවන්ගේ )
2. රසවාහිනිය නම් කෘතිය රචනා කළේ .............. ය (මහනුවර යුගයේ දී / දඹදෙණි යුගයේ දී)
3. වඩුන්නාගල ප්‍රදේශයේ පාලකයා වූයේ ...................ය. (මහෝදර නා රජු /චූල්ලෝදර නා රජු)
4. ............... වැනි රජවරු නාගදීප චෛත්‍ය වැඳ පුදාගත් බව ඉතිහාසයේ සඳහන් වේ. (දේවානම්

   පියතිස්ස/ දුටුගැමුණු )
5. නාගදීප චෛත්‍ය ලංකාවේ ප්‍රධාන සිද්ධස්ථාන ................එකකි (හතෙන් /දහසයෙන් )